# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 3 ශ්‍රේණිය - පරිසරය (නොවැම්බර්-1 සතිය)

## 14 තේමාව - අපට කළ හැකි වෙනස්කම්

දුවේ පුතේ, අද ඔයාලාට වෙනස් විදිහේ දෙයක් කරන්න පවරනවා.

- මේ කාර්ය පත්‍රයත් පැන්සලත් අරගෙන මූණ බලන කණ්ණාඩිය ඉදිරියට යන්න. ඇතිනම් (✓) ලකුණ ද නැතිනම් (X) ලකුණ ද යොදන්න.
    - අත ඇඟිලිවල සහ පා ඇඟිලිවල නිප කපා ඇද්ද? (..........)
    - හිස තෙල්ගා මැනවින් පීරා ඇද්ද? (..........)
    - ඇඳුමේ කොලරය, අත්යට, සාක්කු අවට කුණු තැවරී නැතිද? (..........)
    - වැළමිට, දණහිස, කිහිලි ආදී ප්‍රදේශ නිසි පරිදි පිරිසිදු කර ඇද්ද? (..........)
    - හොඳින් දත් මැද මුවසෝදා ඇද්ද? (..........)

- ඔබ දෙස ඔබම බලාගත්තා නේද?
- ඉහත සියල්ල ම ඇතිනම් ඔබ පිරිසිදු, හැඩකාර, නීරෝගිමත් ළමයෙක්.
- නිවාඩුවට ගෙදර හිටියත් පිරිසිදුව ලස්සනට ගෙදර ඉන්න ඕනෑ.
- ගෙදර ඉන්න අනිත් අයටත් පිරිසිදුව ඉන්න උදව් කරන්න.

ගැලපෙන වැකි යා කරන්න.

| | |
|---|---|
| 1. දෑතේ නිය වැඩෙනම් කපා ඉවත් කරන්න. | ශරීරයේ දද කුෂ්ඨ ඇති වේ. |
| 2. නිසි පරිදි දත් නොමැදීමෙන්. | විෂබීජ අත් මඟින් මුඛයට ඇතුලු වේ. |
| 3. ඇඟපත පිරිසිදු නොකිරීමෙන්. | කට ගඳ ගැසීම, දත් නරක් වීම සිදුවේ. |
| 4. පිරිසිදු ඇඳුම් ඇඳීමෙන්. | දකින අයට ප්‍රිය උපදවයි. |

E nanapiyasa 3 ශ්‍රේණිය පරිසරය -14 තේමාවට අදාල වීඩියෝව නරඹන්න.